


''මම අනුරාධ.. අනුරාධ කීර්තිබණ්ඩාර''

දිලීප ඒ හඳුන්වාදීමෙන් තිගැස්සුණේ ය.

අනුරාධ..

මේ ඔහු නොවේ ද..? ඔහු මුහුණට මුහුණ හමු වී ඇත. සිත ගත කෝපයෙන් ගිනියම් ව එනු දිලීපට දැනුණි. දෑස මොහොතකට අනුරාධගේ මුහුණ මත රැඳවුණි.

අනුරාධ ආයාසයෙන් සිනාසුණේ ය. යමක් කියන්නට ඇවැසි මුත් කිය යුත්තේ කුමක්දැයි සිතා ගත නොහැක-ව මෙන් ඔහු බලා සිටියේ ය.

''මං.. මං නිෂාඩි ට කොහොම ද කියලා බලලා යන්නයි ආවෙ..'' ඔහු ආයාසයෙන් කීවේ ය.

දිලීප ගේ මුහුණ දෙස කෙළින් බලන්නට නොහැකි බවක් ඔහුට දැනුණි. ඔහු හිස හරවා ඇඳ මත නිදා සිටි නිෂාඩි දෙස බැලුවේ ය. සුව නින්දක වැටී සිටි ඇගේ දසුන ඔහු සිත දවා අලු කළේ ය. කඳුලක සිසිල ඔහුගේ ඇසට දැනුණි. හදවත මහා බරක් තැබූ කළෙක මෙන් වේදනාවෙන් බර විය. ඇය වෙත යන්නට ඇගේ හිස අද්දරින් සිට ගන්නට ඇගේ හිස පිරිමදින්නට ඔහු ට ඇවැසි විය. ඇගෙන් සමාව ඉල්ලන්නට ඔහුට ඇවැසි විය. එනමුදු ඉදිරියට තබන්නට එසවූ පය ඉදිරියට නොතබා ම ඔහු නැවතී බලා සිටියේ ය.

දිලීප කිසිවක් නොකියා ජනේලය වෙත ගියේ ය. අනුරාධ ඒ අසළ සිටින බව හෝ නොදත්තා සේ ජනේලයෙන් පිටත ඈත අහස දෙස නෙත් යොමා සිටියේ ය. ඔහු හා කතා කර සිය කෝපය පිට කර ගන්නට දිලීපට අවශ්‍ය නොවී ය. මෙය සිත සන්සුන් කර ගත යුතු මොහොතක් බව ඔහුගේ සිත මොර ගා කීවේ ය. සිය සසළ සිත සන්සුන් කර ගන්නට ඔහුට අවශ්‍ය විය.

තමා නොදන්නා යමක් සිදුවී ඇති බව සැබෑ ය. ඒ ගැන දැනගන්නට ඇති අවශ්‍යතාව සිතට වද දෙන බව ද සැබෑ ය. එනමුදු මේ ඒ ගැන සොයන්නට වේලාව නොවේ යයි දිලීපට සිතෙයි. දැන් කළ යුතු එකම සහ අවශ්‍යම කාරිය හැකි ඉක්මනින් නිෂාඩි සමඟින් ලංකාවෙන් පිටව යාම බව ඔහුගේ සිත කියයි.

ලංකාවට එන්නට කිසිම අවශ්‍යතාවක් නිෂාඩිට නොවූ බව දිලීප දැන සිටියේ ය. ඇය බලවත් අකැමැත්ත පෙන්වද්දී බලෙන්ම පන්නා එව්වේ තමා ය. ඇය ආවේ ඒ පිළිබඳ නෝක්කාඩු කියමින් ය. මේ ගමන මේ තරම් ව්‍යසනයකට මඟ පාදනු ඇතැයි යාන්තමින් හෝ හැඟීමක් වූයේ නම්... තමා කළේ වරදක් ද යන්න තවමත් ඔහුට නොවැටහෙයි.

*සිය කැළඹුන සිත සන්සුන් කර ගනිමින් ඔහු නිෂාඩිගේ ඇඳ අසළ පුටුවේ වාඩි විය. ඉතා සීරුවෙන් නිෂාඩිගේ අතින් අල්ලා ගත්තේ ය. ඒ ස්පර්ශයේ රළු බව නිෂාඩි නින්දෙන් පුබුදුන්නට සමත් විය.*

දිලීප ගේ හැසිරීම අනුරාධ බලාපොරොත්තු නොවූවක් විය. ඔහු බොහෝ සේ කෝප ගනු ඇතැයි ද තමා සමඟ දබරයට එනු ඇතැයි ද අනුරාධ සිතුවේය. එසේ වූවා නම් එය සාධාරණ ය. ඔහුගේ බිරිඳ හා හාද වූයේ තමා ය. ඇය අනතුරේ හෙළුවේ ද තමා ය.. දිලීප ගේ ඕනෑම ප්‍රතික්‍රියාවක් ඉවසා සිටින්නට අනුරාධ හිත හදාගෙන සිටියේ ය. එහෙත් දැන් ඒ සියල්ල වෙනුවට මේ අසාමාන්‍ය මිනිසා තමා නොතකාම ජනේලයෙන් ඉවත බලා සිටියි.

ආපසු හැරෙන්නට අනුරාධ ට අවශ්‍ය විය. එහෙත් නිෂාඩි කෙරෙහි වූ බලවත් අනුකම්පාවත් ආදරයත් ඔහු වළකාගෙන සිටියේ ය.

ඔහු බොහෝ වේලාවක් තමා සිටි තැන සිටම නිෂාඩි දෙස බලා සිටියේ ය. ඇය එක් මො-හොතකට ඇස් ඇර තමා දෙස බලනු ඇත යන බලපොරොත්තුවෙන් ඇසි පිය නොහෙලා ඇය දෙස බලා සිටියේ ය. ඇයත් තමාත් කෙරෙහි උපන්නාවූ මහත් අනුකම්පා-වක් අනුරාධගේ සිත පෙළා දැම්මේ ය. මේ ආදරණීය යුවතිය කිසිදා හැර යා නොහැකි බව ඔහු පසක් කරගෙන සිටියේ ය.

තාරකා විජිතයේ දැල්වෙනා
සඳේ සිසිලසේ හිනැහෙනා
මගේ සිත ළඟම දැවටෙනා
පහන් තරුව නුඹමයි

ඉහ ඉද්දරට වී සිටින්නම්
නළලතේ හාදුවක් තබන්නම්
රහසින් වගේ විත් කියන්නම්
සෙනෙහසින් ඔබ ළඟම රැඳෙන්නම්

දිලීප ආපසු හැරෙන විට අනුරාධ එහි නොවී ය. ඔහු කොයි වේලාවේ ගියා දැයි සිතන්නට වත් අවශ්‍යතාවක් දිලීපට නොවී ය. සිය කැළඹුන සිත සන්සුන් කර ගනිමින් ඔහු නිෂාඩිගේ ඇඳ අසළ පුටුවේ වාඩි විය. ඉතා සීරුවෙන් නිෂාඩිගේ අතින් අල්ලා ගත්තේ ය. ඒ ස්පර්ශයේ රළු බව නිෂාඩි නින්දෙන් පුබ-දුන්නට සමත් විය. ඇස් ඇර බැලූ ඇය දෙටුවේ තමා දෙස මහත් ඕනෑකමකින් බලා සිටිනා දිලීප ය. ඔහුගේ බැල්මේ තිබූ මෘදු බව ඇයට දරාගත නොහැකි තරම් විය. ඈ වහා සිය අත ඇද ගත්තා ය.

''ඇයි. .?'' ඔහු පහත් හඬින් ඇසුවේ ය. ඈ පිලිතුරක් නොදුන්නා ය.

''ඇයි මං අතින් අල්ලනවටත් කැමති නැත්තෙ .?'' ඔහු නැවත ඇසුවේ ය. නිෂාඩි දෑස් වසා ගත්තා මිස පිලිතුරක් නොදුන්නා ය. ඔහුට දෙන්නට පිළිතුරක් සිත තුළ තිබූ නමුදු එය වචන වලට පෙරළන්නට තරම් යහපත් මානසිකත්වයක් ඇයට නොවී ය. නිහඬව සිටීම ම පිලිතුරක් නොවන්නේ ද?

''මට. . මට... පාඩුවෙ ... ඉන්න ... දෙන්න...'' ඈ ඉතා පහත් හඬකින් කීවා ය. ඔහුගේ මුහුණ වෙනස්ව යනු ඇය දුටුවා ය.

ඔහු ටික වේලාවක් ඇය දෙස බලාසිට සුසුමක් හෙළා පුටුවෙන් නැගිට්ටේ ය. නිෂාඩි තමා වෙතින් ඈත්ව බොහෝ දුර ගොස් ඇති බව ඔහු ඒ තත්පර කීපයේදී පසක් කර ගත්තේ ය.

''අපි ඉක්මනින් ආපහු යන්න ඕනෙ...'' ඔහු ඇයට ඇසෙන්නට කීවේ ය. ''... ඉක්මනින්ම...''

0000000000

''මට වැඩිය දවසක් මෙහේ ඉන්න බැහැ අනුර.. .. ඉක්මනට නිෂාඩි එක්ක මම ආපහු යන්න ඕනෙ..'' දිලීප මේසය මත වූ තේ කෝප්පය දෙස බලාගත්වන ම කීවේ ය.

අනුර හිස ඔසවා පවිත්‍රා දෙස බැලුවේ ය. ඇය යමක් කියනු ඇතැයි ඔහු බලාපොරොත්තු වූයේ ය. තත්පර කීපයක නිහඬතාවක් ඔවුන් අතර විය.

''නිෂාඩි එච්චර ඉක්මනට එක්ක යන එක හොඳ නැහැ නේද.?'' පවිත්‍රා නිහඬතාව බිඳිමින් ඇසුවා ය. දිලීප තේ කෝප්පය කරකවමින් එදෙස බලා සිටියා පමණි.

''දිලීප සැකයක් ඇති කරගන්න එපා. අපි නිෂාඩි හොඳට බලාගන්නම්. කෙරෙන්න ඕනෙ ඔක්කොම දේ අඩුවක් නැතිව කරන්න අපට පුලුවන්. .'' අනුර පවිත්‍රාට සහයෝගයක් දෙන අටියෙන් කීවේ ය. දිලීප හිත යටින් ඔහුට සිනාසුණේ ය.



''මේ දේවල් මෙහෙම වුණේ උඹලා බලා ඉදිද්දි නේද...?'' ඔහු සිතින් ඇසුවේ ය.

'' මම කියන්නෙත් මේ අනුර පුතා කියන එකම තමයි පුතා...'' බොහෝ වේලාවක් නිහඬව අසා සිටි සමරකෝන් කීවේ ය. '' අපේ දූ බලාගන්න අපට ඇහැකි... පුතා හිත කලබල කර ගන්න එපා...''

දිලීප හිස හරවා මාමණ්ඩිය දෙස බැලුවේ ය. ඒ බැල්මේ තිබූ නොපහන් බව සමරකෝන් වහා වටහා ගත්තේ ය.

''නැහැ තාත්තා... මම කැමති නැහැ තව දුරටත් නිෂාඩිව මෙහේ තියන්න...'' පළමු වතාවට දිලීප සිය අප්‍රසාදය ප්‍රකාශ කළේ ය.

''පුතා හිත කලබල කරගන්න ඕනෙ නැහැ... ඔය පත්තර කාරයෝ කියන ඒවා ඇත්ත නෙවෙයි... දන්නවනේ උන්ගෙ හැටි... කෙන්ද කන්ද කරලා ලියන්නෙ... නැද්ද නෝනා...'' සමරකෝන් උළුවස්සට හේත්තු වී කතාවට සවන් දෙමින් සිටි සිය බිරිඳ දෙස බැලුවේ ය.

''ඕව කියන්නත් දේවල් ද...? අපේ දූ ගැන අපි දන්නෙ නැද්ද... අනේ මගේ කෙල්ල ... ඔයින් බේරුණා ඇති...'' සුධර්මා සාරි පොටින් ඇස රැඳි කඳුළු පිසදා ගත්තා ය.

දිලීප බොහෝ වේලාවක් අරමුණකින් තොරව ඈත පොල් රුප්පාව දෙස බලා සිටියේ ය. කියන්නට බොහෝ දේ ඔහු සිත තුළ විය.

''... ඕවා කියලා මේ වයසක මිනිස්සුන් රිද්දලා වැඩක් නැහැ...'' ඔහු සිතුවේ ය.

''මම ඉක්මනින් ආපහු යනවා... යනකොට නිෂාඩිවත් එක්ක යනවා...'' දිලීප දැඩි ස්වරයකින් කීවේ ය.

''... තව දුරටත් එයාව මෙහේ තියන්න මට බැහැ...'' ඔහු කීවේ පුටුවෙන් නැගී සිටින අතරය. ''අපි යමු...'' ඔහු අනුර දෙස බලා කීවේ ය.

''පුතා අද මෙහෙ ඉඳලා යන්න...'' සුධර්මා යුතුකමක් ලෙස කීවා ය. ඔහු කිසි දිනෙක තම නිවසේ නතර නොවූ බවත් නතර නොවන බවත් ඇය දනියි. මෙයට පෙර ලංකාවට ආ සෑම වතාවකම ඔහු නැවතුණේ හෝටලයක ය.

''නැහැ අම්මා... මං හොටෙල් රූම් එකක් බුක් කරලයි ආවෙ...'' දිලීප ඇගේ ඉල්ලීම වහා ප්‍රතික්ෂෙප කළේ ය. සමරකොන් බිරිඳගේ මුහුණ දෙස බැලුවේ . ''මොකටද ඇහුවෙ.?'' යි ඔහු නොඇසුවද ඒ බැල්මේ තේරුම සුධර්මා වටහා ගත්තා ය.

''ඔය මුඩුමයා මගේ දුවට හරියට සැළකුවේ ම නැහැ...එදත් නැහැ... අදත් නැහැ...'' දිලීප අනුර හා පවිත්‍රා පිටව ගිය පසු සමරකෝන් කීවේ ය.

''කෙල්ල සතුටෙන් නෙවෙයි එහේ හිටියෙ... එවපු හැම ලියුමකම ලියලා තිබුණා... පව්... මේ පාර ලංකාවට ඇවිත් කොයි තරම් සතුටෙන් ද හිටියෙ... මා එක්ක කීප වතාවක්ම කිව්වා ආපහු යන්න කැමති නැතෙයි කියලා...'' සුධර්මා කීවේ දුකෙනි.

000000

කුමාර අනුරාධ ගේ කාමරයට ඇතුල් නොවී දොර අසළ සිට ටික වේලාවක් බලා සිටියේ ය. දිග කල්පනාවක සිටින අනුරාධ තමා නොදුටු බව ඔහුට වැටහිණි.

*නිෂාඩි සිටියේ ඇඳ විට්ටමට හිස තබාගෙන දෑස් පියාගෙන ය. දිලීප ගිය වේලේ සිටම ඇගේ සිතට සහනයක් නොවී ය. ඉතා ඉක්මණින් ඔහු තමා ද රැගෙන ආපසු යන බව ස්ථිර ය. එයින් ගැලවෙන්නට තරම් ශක්තියක් තමා සතු ද...?*

''අනුරාධ අයියා...'' ඔහු දොර අසළ සිටම කතා කළේ ය. අනුරාධ හිස හරවා බැලුවේ ය.

''මල්ලි... මං දැක්කෙම නැහැ'' අනුරාධ සිනා-සෙන්නට වෑයම් කළේ ය.